# සිරිධම්ම විද්‍යාලය
# SIRIDHAMMA COLLEGE

## 6 ශ්‍රේණිය - පළමු වාරය, පැවරුම 1, 2020

## භූගෝල විද්‍යාව

**ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන වාක්‍ය නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යොදන්න.

1) දිස්ත්‍රික්ක දෙකක් එකතු වීමෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සෑදේ ( )
2) දරුවා විධිමත් අධ්‍යාපනය පාසල තුළින් ලබා ගනී. ( )
3) පරිපාලන කොට්ඨාස ධූරාවලිය තුළ විශාලතම පරිපාලන ඒකකය පළාත වේ. ( )
4) ඌව පළාතට දිස්ත්‍රික්ක තුනක් අයත් වේ. ( )
5) පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්ක වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක වේ. ( )
6) ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන පළාත් ගණන 10 කි. ( )
7) අප පාසල පිහිටා ඇති දිස්ත්‍රික්කය මාතර දිස්ත්‍රික්කය වේ. ( )
8) පාසලක අනන්‍යතාවය දැක්වීමේදී මුලින්ම සඳහන් කළ යුත්තේ එය පිහිටි පළාතයි. ( )
9) පාසලේ දළ සැළැස්මක් ඇදීමේදී එහි ඇති විවිධ දේ නිරූපණය කිරීමට චිත්‍ර යොදා ගනු ලබයි. ( )
10) දිශාව හඳුනා ගැනීමට මාලිමා යන්ත්‍රය උපයෝගී කරගනු ලබයි. ( )

(ලකුණු 20)

02. පහත දැක්වෙන වාක්‍ය වල හිස්තැන් සඳහා ගැලපෙන පිළිතුර ලියන්න.

1) ________________ හා ____________________ දිස්ත්‍රික්ක උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක වේ.
2) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දිස්ත්‍රික්ක __________ කි.
3) දරුවකු කුඩා කාලයේදී තම පවුල තුළින් _______________ අධ්‍යාපනය ලබා ගනී.
4) සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම __________________ හා _____________________ ඇත.
5) මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන ___________ කි.
6) සැලැස්මක් ඇඳීමේදී __________________________ සටහන් කිරීම වැදගත්ය.
7) බස්නාහිර හා උතුරු දිශාවන් අතර __________________ දිශාව පිහිටා ඇත.
8) මාලිමා යන්ත්‍රයක් නොමැති විට ________________ අනුව දිශා හඳුනාගත හැක.

9) දිශා සටහනක දැක්වෙන දිශාවන් ගණන ______________________ කි.

10) උතුරු සහ නැගෙනහිර අතර පිහිටි දිශාව _________________________ දිශාව වේ. (ලකුණු 20)

03. ශ්‍රී ලංකාවේ පළාත් නම් කර එක් එක් පළාතට අයත් දිස්ත්‍රික්ක මොනවාදැයි ලියන්න. (ලකුණු 20)

04. ඔබ පාසලේ දළ සැලැස්මක් අඳින්න. (ලකුණු 20)

05. ඔබ ජීවත් වන දිස්ත්‍රික්කයේ පිහිටි පාසල් 10 ක නම් ඒවායේ අනන්‍යතාවය තහවුරු වන පරිදි ලියන්න. (ලකුණු 20)